සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ එහි පරිපාලිතය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සේවායෝජකයින් විසින් මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලබන දායක මුදල් ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කල යුතුය .එහෙත් 1981 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා සේවායෝජකයින් 5553ක් විසින් මණ්ඩලය වෙත බැර කරන ලද රු.මිලියන 611 ක දායක මුදල් මෙතෙක් සාමාජික ගිණුම්වලට බැර කර නොතිබුණු අතර මේ තුල ඇතුලත් 2015 ත් 2023 කාල පරිච්ඡේදයට අදාල මුදල රු.මිලියන 597 කි .මේ හේතුවෙන් සාමාජික අරමුදල් ශේෂය හා කේවල ගිණුම් ශේෂ අතර ද නොසැසඳීම මෙන්ම සාමාජිකයන්ට තම දායක මුදල් ආපසු ලබාගැනීමේ දී අවාසිදායක තත්ත්වයකට මුහුණ පෑමට ද සිදු වී තිබුණි.	1981-2014 දක්වා කාලපරිච්ඡේදයට අදාලව විභජනය නොකළ ශේෂය රු.මිලියන 14.547 වන අතර මෙම ශේෂය ප්‍රධාන වශයෙන් සේවායෝජක ආයතන 03කට අදාලව වේ. එම ආයතන පිළිවෙලින් මීට වසර 35කට, වසර 31ට සහ වසර 17කට පෙර වසා දමා තිබෙන බැවින් එම මුදල් විභජනය සඳහා සාමාජික විස්තර අප සතුව නොමැති බැවින් 1981 – 2014 කාලපරිච්ඡේදයට අදාලව විභජනය නොකරන ලද මුදල් තාවකාලිකව අවහිර කිරීමට කටයුතු කරන බව හා 2025 මැයි 14 දිනට 2015-2023 කාලපරිච්ඡේදයට අදාල විභජනය නොකරන ලද දායක මුදල්වල එකතුව රු.මිලියන 597 දක්වා අඩු වී තිබෙන අතර සක්‍රීය ආයතනවලට අදාලව සාමාජික තොරතුරු ලබාදී නොමැති සේවායෝජකයන්ගෙන් එක් එක් ලැබීම්වලට අදාලව විස්තර ප්‍රාදේශීය කාර්යාලවලට ලබාදී අක්‍රීය සේවායෝජක ආයතනවල සේවායෝජකයින් විසින් මහා බැංකුවේ සේවක අර්ථසාධක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සේවායෝජකයන් 150 කට අදාලව "C" වාර්තා 790ක් පමණ අපවෙත ලබාදී තිබේ. මේ අනුව විභජනය නොකරන ලද දායක මුදල් සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කරමින් පවතින බව.	දායක මුදල බැරවිය යුතු සාමාජිකයින් නිවැරදිව හදුනා ගැනීම, සාමාජික මුදල් අයකිරීමේ නව ක්‍රම වේදය වැඩි දියුණු කිරීම හා හඳුනා නොගත් මුදල් කඩිනමින් හඳුනාගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(ආ)	සාමාජික නම හා වලංගු හැඳුනුම්පත් අංකය රහිතව පවත්වාගෙන යනු ලබන ගිණුම් 212 කට අදාලව රු.මිලියන 1.22ක මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට පැවති අතර 2025 අප්‍රේල් 30 වන විටත් මෙම ගිණුම් හඳුනාගෙන සාමාජිකයන්ට බැර කර නොතිබුණි.	හඳුනාගත නොහැකි දායක මුදල් සම්බන්ධයෙන් වූ සාමාජිකයන්ගේ නම සහ හැඳුනුම්පත් අංකය සහිතව පවතින සාමාජික ගිණුම් 212 න් සාමාජික ගිණුම් 3කට අදාලව සාමාජිකයාගේ නම ඇතුලත් කර තිබේ. ඉතිරි සාමාජික ගිණුම්වලට අදාල දායක මුදල් 1981-2002 ත් අතර කාලපරිච්ඡේදයට අයත් වන අතර එම කාලයට අදාල වාර්තා නොමැති බැවින් මෙම ගිණුම් අක්‍රිය ගිණුම් බවට පත්කර යම් අවස්ථාවක අදාල සාමාජිකයාගේ සනාථ කළ හැකි තොරතුරු ඉදිරිපත් කළහොත් එම ගිණුම නැවත සක්‍රිය කර මුදල් ගෙවීමට කටයුතු කරනු ලබන බව.	ශේෂ හඳුනාගෙන සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	සේවායෝජකයින් විසින් දායක මුදල් මණ්ඩලය වෙත ප්‍රේෂණය කර ඇති නමුත් එම සේවායෝජකයින් හඳුනාගත නොහැකිව V999 හා V100 අවිනිශ්චිත ගිණුම්වල පවතින ශේෂ එකතුව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6.62 කි. 1996 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පවතින මෙම මුදල් මෙතෙක් අදාල සාමාජික ගිණුම්වලට බැර කර නිරවුල් කර නොතිබුණි.	ඇතැම් සේවායෝජකයන් දායක මුදල් මණ්ඩලය වෙත ප්‍රේෂණය කර ඇතත් එම ගෙවීම් කරන ලද සේවායෝජකයන් පිළිබද විස්තර නියමිත පරිදි නොලැබීම හේතුවෙන් හඳුනාගැනීමට නොහැකි මුදල් V100 හා V 999 අවිනිශ්චිත ගිණුම්වලට ගිණුම්ගත කොට සේවායෝජක තොරතුරු ලබාගැනීමෙන් පසු අදාල ගිණුම්වලට මාරුකිරීම සිදුකෙරේ. එම මුදල් අතුරින් 2020 ට පසු සේවායෝජකයින් විසින් බැංකුගත කර තිබූ රු.මිලියන 0.39 වූ මුදලට අදාල ගෙවීම් විස්තර වරින්වර සේවායෝජකයින් විසින් සපයනු ලබන අතර අදාල අවස්ථාවන්වලදී එම ගෙවීම් V999 ගිණුමේ සිට නිවැරදි සේවායෝජක ගිණුම්වල ගිණුම්ගත කිරීම සිදුකරනු ලැබේ. එහෙත් 2006 වසරට පෙර සිදුකර ඇති රු.මිලියන 6.23 ක් වූ බැරකිරීම් මේ වනවිට හඳුනාගත නොහැකි බැවින් හා ඒ සම්බන්ධ ඉල්ලීම් සිදුනොවන බැවින් එම මුදල් ඉවත්කිරීම සඳහා වන අනුමැතිය ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් ලබාගැනීමෙන් අනතුරුව ඉවත්කිරීම සිදුකිරීමට නියමිත බව.	-එම-

1.5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	යාවත්කාලීන කල විගස ලබාදීමට කටයුතු කරන බව	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් වත්කම් යටතේ දක්වා තිබූ රු.මිලියන 5.58ක් වූ තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් ශේෂ තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ශේෂ සනාථන ලිපි මෙතෙක් ලැබී නොමැති අතර ලද විගස ඉදිරිපත් කරන බව	ශේෂය සනාථන ලිපි කඩිනමින් ගෙන්වාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නවම් මාවත වාහන නැවතුම්කරුවන්ගෙන් 2024 දෙසැම්බර් 31දිනට අයවිය යුතු මුළු හිඟ බදු මුදල රු.මිලියන 6.79ක් වූ අතර මේ තුළ 2016 වර්ෂය හා 2024 වර්ෂය යන කාල පරාසයට අයත් ආයතන 63 කින් අයවිය යුතු රු.මිලියන 3.65ක් විය .වර්තමානය වන විටත් ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලය කටයුතු කර නොතිබීම හේතුවෙන් විධිමත්ව හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීමට බාධාවක් පවතින බව නිරීක්ෂණය විය.	ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය උපදෙස් ලබාදී තිබෙන අතර අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතන බව.	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය.
(ආ)	මණ්ඩලය විසින් 1994 වර්ෂයේදී සියයට 14.48 ක ස්ථාවර පොළී අනුපාතයක් යටතේ වැව්ලි සමාගමක කරන ලද රු.මිලියන 15ක ණයකර ආයෝජනය වෙනුවෙන් 2024දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ පොළී මුදල රු.මිලියන 26.29 ක් විය. මේ සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දින අදාල ආයතන හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මැදිහත් වීම මත කරන ලද සාකච්ඡා අනුව හිඟ මුදල මණ්ඩලයට ගෙවීමට පියවර ගන්නා ලෙස නියම කර තිබුණද, 2024 දෙසැම්බර් අවසානය වන විටත් මෙම මුදල් මණ්ඩලය වෙත අයකර ගැනීමේ නිශ්චිත තහවුරුවක් නොතිබුණි.	හිඟ පොළී මුදල පියවීම සඳහා ඇල්කඩුව වැව්ලි සමාගමෙන් වාරික සැලැස්මක් (Repayment Plan) මේ වනවිට ඉදිරිපත් කර තිබෙන අතර එය අධ්‍යනය කිරීමෙන් අනතුරුව දෙපාර්ශවයේ එකඟතාවය මත එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව.	පසු විපරම් කටයුතු සිදුකර අයවිය යුතු පොළී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	2002 වර්ෂයේ දී කල්පිරිමට යටත්ව සමාගමක පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 12.17ක් සඳහා සහ 2007 වර්ෂයේ දී කල්පිරිමට යටත්ව ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 7.45 සඳහා අයවිය යුතු පොළී මුදල් පිළිවෙලින් රු.මිලියන 15.21 ක් හා රු.මිලියන 0.37 ක් විය .මෙම ආයතනය ඇවර කිරීම සඳහා 2008 ඔක්තොම්බර් 03 දින දිසා අධිකරණයේ නියෝග ගබා දී තිබුණද 2024 දෙසැම්බර් අවසානය වනවිටත් මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි .මේ නිසා	සමාගම ඇවර කිරීම සඳහා 2018 වර්ෂයේදී අධිකරණය විසින් නියෝගයක් ලබාදී තිබුණද මේ දක්වා ඇවරකරුවකු පත් කර නොමැති බව හා පසුකාලීනව මෙම සමාගමේ ණයගැති පාර්ශවයක් විසින් අධිකරණ නියෝගයක් මත රුපියල් මිලියන 42.6ක් වූ මුදලක් මෙම ඇවර කිරීමේ නඩුවේ බැරට	-එම-

	සාමාජිකයන් වෙත ගෙවිය යුතු රු.මිලියන 15.58 ක ප්‍රතිලාභ අඩු වී තිබුණි.	තැන්පත් කර තිබේ .එම මුදලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අයවීමට ඇති මුදලක් ඇතිනම් එය අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් 2024 මාර්තු 12 දින නීතිපති උපදෙස් පතා ලිපියක් යොමුකර තිබේ. එම පිළිතුරුද ලැබුණු පසුව ,එහි අන්තර්ගතයද සළකා බලා මෙම මුදල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව.	
(ඇ)	මණ්ඩලය විසින් නිලධාරීන් 14 කට ලබාදුන් ආපදා හා වාහන ණය මුදලින් රු.මිලියන 5.5ක අය නොවන ශේෂයක් පවතින අතර ,මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	සේවයෙන් විශ්‍රාම ගෙන යාම, සේවය අත්හිටුවීම, සේවයෙන් පහකිරීම යන කරුණු හේතුවෙන් මේ වනවිට මෙකී නිලධාරින් මණ්ඩලීය සේවයෙන් ඉවත් වී ඇති බැවින් ඔවුන්ගෙන් අයවීමට පවතින මුදල් අවසන් ගෙවීම් වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපි යොමුකර ඇති බව.	ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ ගිණුම්වල පවතින ශේෂ එකතුව රු.මිලියන 7.8ක් වූ අතර මේ තුල ඇතුලත් 2001 වර්ෂයත් 2023 වර්ෂයත් අතර කාල පරාසයට අයත් වටිනාකම රු.මිලියන 4.5 ක් විය. ඉකුත් වර්ෂ ශේෂ සාමාජිකයාගේ ගිණුමටම බැර කිරීම සඳහා ක්‍රියාත්මක ක්‍රමවේදය තවදුරටත් වර්ධනය කළ යුතු බව නිරීක්ෂණය විය.	2025 ජනවාරි 01 දින සිට 2025 අප්‍රේල් 30 දක්වා සාමාජිකයන් 38 දෙනෙක් සඳහා රු.මිලියන 1.7ක මුදලක් නිදහස් කර තිබේ. මෙසේ නිදහස් කරන ලද සාමාජිකයින් 38 දෙනාගෙන් 37 දෙනෙක්ම 2024 දෙසැම්බර් මස ආපසු ලැබුණු ප්‍රතිලාභ මුදල් නිදහස් කිරීම් වන අතර එය රු.මිලියන 1.6කි. කිසියම් මූල්‍ය වර්ෂයක් සඳහා මුලින් තීරණය කරන ලද පොළී අනුපාතය, පසුව වැඩිකිරීම නිසා එම වැඩිකරන ලද දිනය දක්වා ගෙවීම් කරන ලද සාමාන්‍ය ප්‍රතිලාභ අයදුම්පත් සඳහා වැඩි වූ පොළී අනුපාතය යටතේ හිමි පොළිය සාමාජිකයින්ට ගෙවිය යුතුවේ. 2018, 2021 සහ 2023 වර්ෂවලට අදාලව ඊළඟ වසරේ ජනවාරි 01 දින තීරණය කරන ලද පොළී ප්‍රතිශතය පසුව	අදාල ප්‍රතිලාභය හඳුනාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය

		පිළිවෙලින් සියයට 0.5 කින්, 1.75 කින් හා සියයට 1 කින් වැඩි කරන ලද බව.	
(ආ)	නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කුලී පදනමින් පවත්වාගෙන යනු ලබන මණ්ඩලයේ ලේඛනාගාරය සඳහා 2022 අප්‍රේල් සිට 2024 දෙසැම්බර් දක්වා විධිමත් කුලී ගිවිසුමකට එළඹීමට මෙතෙක් කටයුතු කර නොතිබුණු අතර, මෙම කාලයට අදාලව ගෙවිය යුතු හිඟ මුදල රු.මිලියන 6.4 ක් විය.	ගබඩා පරිශ්‍රය මණ්ඩලයේ ලේඛණාගාරයක් ලෙස පවත්වාගෙන යාමට 2019 වර්ෂයේදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් යටතේ පැවැති නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය වෙතින් විධිමත්ව ලබාගෙන තිබූ අතර, 2022 අප්‍රේල් මාසයේ සිට එම ගබඩා පරිශ්‍රය නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතී. නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගොස් හමුවී සාකච්ඡා කරන ලදී. එහෙත් ඒ පිළිබඳව පිළිතුරක් නොලැබුණු බැවින් අප විසින් නැවතත් සිහිකැඳවීමේ ලිපියක් 2025 පෙබරවාරි 17 දින යොමුකර ඇති අතර නැවත දුරකථන ඇමතුම් ලබාදී මේ පිළිබඳ සිහිකැඳවීම් සිදුකරන ලදී. මණ්ඩලය විසින් කුලී පදනම මත ලබාගෙන ඇති මෙම ගොඩනැගිලිවලට අදාලව බදු ගිවිසුම් සකස් කිරීම බදුදීමනාකරු විසින් සිදුකරනු ලබයි. එබැවින් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමාදය මත මෙම ගිවිසුම්ගතවීම ප්‍රමාද වී ඇති අතර ගිවිසුමකින් තොරව මෙම මණ්ඩලයට කුලී ගෙවීම් සිදුකළ නොහැකි බැවින් ගාස්තු සඳහා දඩ මුදල්ද එකතු කර තිබේ. මෙකී ගිවිසුම්ගත නොවීමේ ගැටලුව පිළිබඳ මේ වනවිට ද නාගරික සංවර්ධන අධිකාරියේ අදාල නිලධාරින් සමඟ සාකච්ඡා කරමින් පවතින බව.	විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කල යුතුය.
(ඇ)	වාර්ෂික ක්‍රියාකාරී සැලසුම මගින් 2024 වර්ෂයේ දී මරණ ප්‍රතිලාභ ගෙවීම සඳහා ගතවන කාලය දින 40ක් දක්වා අඩුකිරීමට සැලසුම් කර තිබුණද සත්‍ය දින ගණන 60 ක් ලෙස වාර්තා කර තිබුණි. 2023 වර්ෂයේදී මේ සඳහා ගතකල කාලය දින 60 ක් විය. 2024 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ වටිනාකම ප්‍රතිලාභීන් 1,295 කට අදාලව රු.මිලියන 27.9 ක් වූ අතර ඉකුත් වර්ෂයේ මෙම වටිනාකම රු.මිලියන 23.37 ක් විය . නාමිකයන් පිළිබඳ ගැටළු අවම කර ගැනීම සඳහා සාමාජිකයින්ගේ තොරතුරු සඳහා දත්ත පද්ධතියක් සකස් කර තොරතුරු නොමැති කොටස් සම්පූර්ණ කර ගැනීම හා	2024 වර්ෂයේදී මරණ ප්‍රතිලාභ අයදුම්පත් 2,872ක් ගෙවීම් කර තිබේ. ලබාදී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර භාරදෙනු ලබන ප්‍රතිලාභ අයදුම්පත්‍ර කඩිනමින් ගෙවීම් කළහැකි අතර අසම්පූර්ණ අයදුම්පත්‍ර ගෙවීම් කිරීමට දින 40 ඉක්ම වූ කාලයක් ගතවී තිබුණි. මරණ ප්‍රතිලාභ හිමිකම් ඉල්ලුම්කරනු ලබන්නේ සාමාජිකයාගේ උරුමකරුවන්, යැපෙන්නන් හෝ නාමිකයන්ය. සාමාජිකයා මියගියාට පසු ඔහු හෝ ඇය සේවය කළ ආයතන පිළිබඳ තොරතුරු උරුමකරුවන් හෝ යැපෙන්නන් නිවැරදිව නොදන්නා බැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී බොහෝවිට අඩුපාඩු පවතී.	නිවැරදි උරුමකරුවන්ට හා යැපෙන්නන්ට ගෙවීමට කටයුතු කළ යුතුය.

යැපෙන්නන් පිළිබඳව මණ්ඩලයේ පවතින පද්ධතිය යාවත්කාලීන කර ගැනීමට විගණන හා කළමණාකරන රැස්වීම් වලදී තීරණ ලබා දී තිබුනද මෙතෙක් එය ක්‍රියාවට නංවා නොතිබුණි .වාර්ෂිකව නාමික තොරතුරු ලබා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට ගෙවීම කරන අතර 2024 වර්ෂය තුළදී නාමිකයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ට ගෙවා ඇති මුළු මුදල රු 111,525 .කි .	එවැනි අඩුපාඩු අප විසින් අදාල අයදුම්පත් භාරදෙන උරුමකරුවන් හෝ යැපෙන්නන්හට පෙන්වා දුන් පසු ඒවා සම්පූර්ණ කිරීමට යම් කාලයක් ගතවන බැවින් දින 40කට වඩා වැඩි කාලයක් මරණ ප්‍රතිලාභ ගෙවීම් කටයුතු සඳහා ගතවී තිබේ. නිලධාරීන් විශ්‍රාමයාමත්, ස්ථාන මාරුවීම් හේතුවෙනුත් දැනට සේවක පුරප්පාඩු පැවතිය ද සිටින සේවක මහත්ම මහත්මීන් විසින් වසරකට ලැබෙන අයදුම්පත් හැකි ඉක්මනින් හා නිවැරදිව ගෙවීම් කිරීමට කටයුතු කරනු ලබන බව.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/39 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය	2023 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අවම වශයෙන් සේවා නියුක්තිකයන් 15 ක් තම සේවයේ නියුක්තව සිටින සෑම සේවායෝජකයකුම ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මණ්ඩලය වෙත දායක මුදල් හා මාසික වාර්තා ඉදිරිපත් කලයුතු අතර ප්‍රමාදයකින් තොරව දායක මුදල සාමාජිකයන්ට විභජනය කිරීමට සැලස්වීම මෙම ක්‍රියාමාර්ගයේ අරමුණු වී තිබුණි. 2023 වර්ෂයේ දී රු.මිලියන 141 ක දායක මුදල් ලැබීම්වලට අදාලව සක්‍රීය ආයතන 636 ක් විසින් අර්ධ වාර්ෂික වාර්තා මණ්ඩලය වෙත ඒවා නොතිබුණු බව නිරීක්ෂණය විය .එමෙන්ම 2015 වර්ෂය හා 2022 වර්ෂයත් අතර කාල පරිච්ඡේදයට අදාලව මුළු ආයතන 3,263 කින් රු.මිලියන 259 ක් වූ දායක මුදල් වලට අදාලව අර්ධ වාර්ෂික වාර්තා මණ්ඩලය වෙත එවා නොතිබුණි.	2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/39 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව සාමාජිකයන් 15 ට වැඩි සේවකයින් සහිත සේවායෝජකයන් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මණ්ඩලයට දායක මුදල් ගෙවීම අනිවාර්ය කර ඇති බැවින් ඒ සඳහා සේවායෝජකයන් යොමුකිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. 2023 වර්ෂයට අදාලව සක්‍රිය සහ අක්‍රීය ආයතනවලට අදාලව ආකෘති II වාර්තා 1405 ක් සේවායෝජක ආයතන වෙතින් නොලැබීම මත විභජනය කිරීමට නොහැකිව පැවැති දායක මුදල් ශේෂය රු.මිලියන 117 ක් දක්වා අඩු වී තිබේ. ඒ අනුව ප්‍රගතිය රු.මිලියන 24 කි. 2015 - 2022 අතර සක්‍රීය සහ අක්‍රීය සේවායෝජක ආයතනවලට අදාල ආකෘති II වාර්තා 3,336 ක් තවදුරටත් ලැබිය යුතු අතර ඒ තුල විභජනය කිරීමට ඇති දායක මුදල් ප්‍රමාණය රු.මිලියන 171 ක් දක්වා අඩු වී තිබු අතර ප්‍රගතිය රු.මිලියන 88	සේවායෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා වෙනත් ක්‍රියාමාර්ග තුලින් වාර වාර්තා ගෙන්වා ගැනීම කඩිනම් කල යුතුය.

			කි. මහ බැංකුවේ සේවක අර්ථසාධක දෙපාර්තමේන්තුව සමග කළ සාකච්ඡා අනුව සේවායෝජක ආයතන 150 කට අදාල "C" වාර්තා 790 ක් පමණ අප වෙත ලැබී තිබූ අතර විභජනය කිරීමට නොහැකිවී තිබූ දායක මුදල් සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කරමින් සිටින බව.	
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	396 (ඇ)	නිකුත් කර මාස 06 ඉක්මවූ මුළු වටිනාකම රු.මිලියන 0.7ක් වූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් ලැයිස්තුවෙහි රු.මිලියන 0.7ක් වූ වටිනාකමට අදාල චෙක්පත් 16 සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	756 (4)	භාණ්ඩ සමීක්ෂණයකදී හඳුනා ගනු ලද පාවිච්චි කල හැකි වැඩිමනක් භාණ්ඩ, වෙනත් ආයතනයක පාවිච්චිය සඳහා ලබා දිමට කටයුතු කළ හැකි නමුත් එලෙස කටයුතු නොකර ටැබ් පරිගණක 48, මොනිටර් 92 ක් ගබඩාවේ නිෂ්කාර්යව පවතී.	යම් භාණ්ඩයක් අනවශ්‍ය වූ විටක කාර්මික විද්‍යාලයකට හෝ රජයේ පුහුණු පාසලකට ලබාදීම අපහරණ කමිටුවේ නිර්දේශයකින් පසුව සිදු කරනු ලැබේ. මෙම අපහරණය කටයුතු කඩිනම් කිරීමට නියමිත බව.	-එම-
(iii)	756 (6)	2024 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2025 මාර්තු 15 ට පෙර නිමකර අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2025 මාර්තු 31ට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, 2025 අප්‍රේල් 30 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කර නොතිබුණි. එමෙන්ම 2023 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් අනාවරණය වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ද අදාල ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොතිබුණි.	මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව 2024 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2025 අප්‍රේල් මස 04 වන දින ආරම්භ කරන ලදි මේ වනවිට අවසන් අදියරේ පවතින බැවින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මැයි 31 වෙනි දිනට ප්‍රථම ලබාදීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම 2023 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් අනාවරණය වූ ඌණතා හා අතිරික්තතාවයන්ට අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව.	-එම-

(iv)	1646 (ඇ)	ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත්ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් සෑම මාසයක් අවසන් වීමෙන් පසුව ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්වාහන 52ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.	ධාවන සටහන් පොතක් සාමාන්‍යයෙන් මාස 3ක් පමණ වූ කාලපරිච්ඡේදයක් භාවිතා කරනු ලබන අතර සෑම මාසයක් අවසානයේදීම වාහන ධාවන සටහන් පොත් ප්‍රවාහන අංශය වෙත නොලැබේ. මින් ඉදිරියට අපවෙත ලැබෙන ධාවන සටහන් පොත් සාරාංශ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව යොමු කරන බව.	-එම-
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.7 ඡේදය	නියමිත සුදුසුකම් නොමැති නිලධාරීන් බඳවා ගැනීම සඳහා පවතින පරිපාටියෙන් බාහිරව කටයුතු කිරීමට අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොමැත.	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	2016 නොවැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය			
(i)	3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකට පසුව මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000ක දුර ප්‍රමාණයක් ධාවන කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කරුණු අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කලයුතු වුවත් වාහන 52ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි.	ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත වාහනවල ඉන්ධන පරිභෝජනය මේ වනවිට පරික්ෂා කර අවසන් කර තිබෙන මුත් ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත වාහනවලට අදාල පරික්ෂාව දෛනික රාජකාරි බහුලවීම නිසා සිදුකිරීමට නොහැකි වී ඇති අතර හැකි ඉක්මනින් අදාල කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ii)	5.1 ඡේදය	ඉන්ධන ප්‍රමාණය හා ධාවනය කරන ලද දුර ප්‍රමාණය ලොග් සටහන් පොතේ දිනපතාම ඇතුලත් කලයුතු වුවත් ,එසේ කටයුතු කර නොතිබුණි.	මණ්ඩලීය රථ සඳහා ඉන්ධන සපයනුයේ රියදුරු සමඟ ලියාපදිංචි පිරවුම්හලක් වෙත නිලධාරි මහතකු ගොස් ඉන්ධන සම්පූර්ණ ලෙස පිරවීම මගිනි. එහිදී රියදුරු වෙත වව්චරයක් ලබාදී රථයේ ඉන්ධන හා	-එම-

			ධාවනය කළ දුර තුලනය කිරීම සිදුනොවේ. එසේ කළහොත් ඉන්ධන පිරවීමේදී යොදන ඉන්ධන ප්‍රමාණය හා ගණනය කළ ඉන්ධන ප්‍රමාණය අතර පරස්පරතාවයක් ඇතිවන බව.	
(iii)	06 ඡේදය	නිල වාහන සඳහා ධාවන සටහන් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	අනුයුක්ත වාහන සඳහා ආකෘති පත්‍රයක් පුරවනු ලබන අතර මින් ඉදිරියට විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 55,200 ක් හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 54,498 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 57,133 ක් හා රු.මිලියන 55,942 ක් විය. ඒ අනුව සමූහයේ හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 193.3 ක හා රු.මිලියන 144.3 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී සමූහයේ හා මණ්ඩලයේ පොලී ආදායම් රු.මිලියන 2,561 කින් අඩු වීම මේ සඳහා හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මිලදී ගැනීමේ අවශ්‍යතා ප්‍රමාණ නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මත 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මණ්ඩලීය කාර්ය මණ්ඩලය සඳහා බෙදා දීමට මිලදී ගෙන තිබූ මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 3.5ක් වූ නිල ඇඳුම් තොගයක් වසර 2ත් - 6ත් අතර කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි.	සෑම වසර 3 කට හෝ 4 කට වරක් භාවිතයට නොගැනෙන අතිරික්ත නිල ඇඳුම් අනුමත අපහරණ ක්‍රියාවලිය අනුගමනය කරමින් ගබඩාවෙන් ඉවත්කිරීමට කටයුතු කෙරේ. එසේම 2018 වසර සිට 2022 වසර දක්වා එකතු වූ නිලඇඳුම් තොග අපහරණය කිරීමේ කටයුතු ද මේ වනවිට සිදුකෙරෙමින් පවතින බව.	අවශ්‍යතා ප්‍රමාණ නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කර මිලදී ගත යුතුය.
(ආ)	මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිරිබෝපුර 90 ග්‍රාම නිලධාරී වසමේ හෙක්ටයාර 0.1012 ක් 2020 ජූලි 03 දින රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කර මණ්ඩලය වෙත පවරා දී තිබුණි 2020 .	2020 ජූලි 03 දිනැති රජයේ ගැසට් පත්‍රයකින් අවුරුදු 30ක බදු පදනම මත හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිරිබෝපුර, 90 ග්‍රාම නිලධාරි වසමේ හෙක්ටයාර 0.1012ක් මණ්ඩලය වෙත පවරා දෙන ලදි. 2020 වර්ෂයේ ඇති වූ කොරෝනා අධිවසංගතය හා අනෙකුත් ආර්ථික අර්බුදයන් හමුවේ ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනු	මිලදී ගත් අරමුණ සඳහා උපයෝජනය කිරීමට ඉදිරියේ දී කටයුතු කල යුතුය.

	වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාර්ෂිකව රු.240,000 බැගින් බදු මුදල් ගෙවීම් කර තිබුණද, අදාල අරමුණ සඳහා උපයෝජනය කරගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	අංක (02)හි 01/2024 ජාතික අයවැය චක්‍රලේඛයේ අනු අංක 07.01 උප ඡේද මගින් ගොඩනැගිලි ඉදිකිරීම් සීමාකර ඇති බැවින් එය ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් භාවිතා කළ නොහැකි වු අතර එවැනි සීමාවන් හමුවේ ඵලදායි ලෙස උපයෝජනය කිරීමට මෙතෙක් නොහැකි වී ඇති බව.	
(ඇ)	චෙක්පත් එකතු කිරීමේ පහසුකම් ලබාදීම වෙනුවෙන් ලංකා බැංකුව හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර 2006 අගෝස්තු 06 දින එළඹි එකඟතාවය අනුව රු.මිලියන 10 ක් ප්‍රතිමිලදී ගැනුම් වල හා රු.මිලියන 490ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. එම පහසුකම් සැලසීම වෙනුවෙන් රු.100,000 බැගින් මාසික ව මණ්ඩලය විසින් ලංකා බැංකුවට ගෙවීම් කරගෙන යනු ලබයි .වසර 10 කට අධික කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන මෙම තැන්පතු සම්බන්ධයෙන් ඉහල ප්‍රතිලාභ අනුපාතයක් මණ්ඩලය වෙත ලබාගැනීම සඳහා ගිවිසුම් සංශෝධනය කර ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාර්ෂිකව අළුත්කිරීමේ පදනම මත රු.මිලියන 500 ක් වූ ස්ථාවර තැන්පතු හා ප්‍රතිමිළදී ගැණුම්වල ආයෝජනය කර ඇත්තේ ලංකා බැංකුව සහ මණ්ඩලය අතර ඇති වූ එකඟතාවයක් අනුවය. ආයෝජනය වාර්ෂිකව අළුත්කරන අවස්ථාවේදී ප්‍රතිමිළදී ගැනීම් හා ස්ථාවර තැන්පතු සඳහා රාජ්‍ය බැංකු 3 හි එදිනට පවතින පොළී අනුපාත සංසන්ධනය කර වඩා වාසිදායක පොළී අනුපාතය යටතේ ලංකා බැංකුවේ ආයෝජනය කරන ලදි. මණ්ඩලය වෙත චෙක්පත් මගින් කෙරෙන දායක මුදල් රැස්කිරීම් සඳහා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන බැංකු ගිණුම වන මෙමගින් 2024 වර්ෂයේ චෙක්පත් 496,027 ක් සඳහා රු.මිලියන 7,049 ක් වටිනා ගණුදෙනු සිදුකර තිබේ. ඊට අමතරව ගිණුමට අදාලව එම වර්ෂයේ අගරු චෙක්පත් 1,583 ක වටිනාකම රු.මිලියන 30.5 ක් වේ. මෙම බැංකු ගිණුම පවත්වාගෙන යාම සඳහා විශේෂ පහසුකම් ලංකා බැංකුව විසින් ලබාදී තිබේ. දිනකට දෙවරක් ලංකා බැංකුවේ චෙක්පත් රැගෙන යාම ද බැංකු ප්‍රකාශන සහ අහරු චෙක්පත් මණ්ඩලය වෙත භාරදීම වැනි බැංකුව විසින් ලබාදෙන සේවාවන් සහ විශේෂ පහසුකම් සඳහා රු.100,000 ක මාසික සේවා ගාස්තුවක් 2005 වර්ෂයේ එකඟ වී ඇති පරිදි වර්තමානය දක්වා කිසිදු වැඩි කිරීමකින් තොරව මණ්ඩලය විසින් ගෙවීම සිදු කරන බව.	මණ්ඩලයට ඉහල ප්‍රතිලාභ අනුපාත ලැබෙන මාර්ගවල ආයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	මණ්ඩලයේ මූල්‍ය අංශයේ මෙහෙයුම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව , ඵලදායිතාවය වර්ධනය කිරීම සහ ගිණුම්කරණ ක්‍රියාවලිය මණ්ඩලයේ අපේක්ෂිත හරයාත්මක පද්ධති (Core System) ව්‍යාපෘති සමඟ	පෞද්ගලික ආයතනයක් සමඟ නඩත්තු ගිවිසුමකට මේ වනවිට එළඹ තිබේ. ඒ අනුව 2025 පෙබරවාරි 17 දින සිට බලපැවැත්වන පරිදි නඩත්තු ගිවිසුම ක්‍රියාත්මක වේ. Core System පද්ධතිය ක්‍රියාත්මක වීම ආරම්භ කළවිට එම	අරමුණු ඉටුකර ගැනීම කඩිනම් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

	අන්තර්ග්‍රහණය කිරීමේ අරමුණින් 2021 මාර්තු 29 දින මණ්ඩලය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය හා ඉවෝල් තාක්ෂණ පුද්ගලික සමාගම අතර ත්‍රෛපාර්ෂික ගිවිසුමකට එළඹ තිබුණි. 2021 අගෝස්තු ගිවිසුම් කාලය නිමාවී 2022 අගෝස්තු මස දක්වා වසරක නඩත්තු හා සේවා කටයුතු ලබාදීමට ගිවිසුම් අනුව එකඟ වී තිබුණ ද ගිවිසුම් කාලය නිමා විමෙන් පසු සහයක හා නඩත්තු ගිවිසුමකට එළඹීම 2025 පෙබරවාරි 27 දින සිදුකර තිබුණි. 2024 වර්ෂයේ දී ගිණුම්කරණ පද්ධතිය ආශ්‍රිත ගැටළුකාරී තත්ත්වයන් වෙනුවෙන් රු 705,820 ක මුදලක් අදාල සමාගම වෙත අමතර වැය දැරීමක් කිරීමට ද මණ්ඩලයට සිදුවී තිබුණි. 2022 සිට 2024 වර්ෂය දක්වා මෘදුකාංග භාවිතය වෙනුවෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ලෙස රු.මිලියන 5.65ක මුදලක්ද ගෙවීම් කර තිබුණි. ව්‍යාපාර අරමුණ වූ හරයාත්මක පද්ධතිය සමග ඒකාබද්ධ කිරීමේ කටයුතුද මෙතෙක් සම්පූර්ණයෙන් ඉටුකර ගෙන නොතිබුණි .	පද්ධතිය සමග මෙම Accpac පද්ධතිය ඒකාබද්ධ කිරීමට කටයුතු කරනු ලබන බව.	
(ඉ)	2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබූ රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් ලෙස සුරැකුම්පත් වෙන්දේසි වලදී ඍජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස ලියාපදිංචි වීම මේ දක්වා සම්පූර්ණ වී නොතිබුණි.	පහසුකම ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට පවතින දුෂ්කරතා, දැරීමට සිදුවන ප්‍රාග්ධන වියදම් සීමා, නව කාර්ය මණ්ඩල බඳවාගැනීම්වලට පවතින සීමා, පවතින වැටුප් පරිමාවන් යටතේ එම ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් දක්ෂ නිලධාරීන් බඳවාගැනීම, රඳවාගැනීම සහ නැවත බඳවාගැනීමට ඇති අපහසුව සහ මීට අදාල අනෙකුත් යටිතල පහසුකම් සපයාගැනීමේ පවතින ගැටළු වැනි කරුණු සලකා බලා මෙම පහසුකම රාජ්‍ය බංකුවක් වන මහජන බැංකුව මගින් කිසිදු වියදමකින් සහ අමතර සේවකයින් යෙදවීමකින් තොරව මෙතෙක් සිදුකරගෙන යනු ලබන බව.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභා රැස්වීමේ දී කළ නියෝග ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේ මිලදී ගෙන තිබූ පිළිවෙලින් වටිනාකම රු.මිලියන 2.33, රු.මිලියන 2.48 ක් හා රු.මිලියන 10.8 ක් වූ ක්ෂණික ප්‍රතිචාර කේත පරිලෝකන යන්ත්‍ර (QR-Code Scanners) 45 ක්, මුද්‍රණ යන්ත්‍ර (QR-Code Printers) 21 ක් හා ලිපිලේඛන පරිලෝකන යන්ත්‍ර (Document Scanners) 14ක් උපයෝජනය කිරීමෙන් තොරව ගබඩාවේ රඳවා තිබුණි .	මණ්ඩලය සඳහා වූ නව හරයාත්මක පද්ධති ව්‍යාපෘතියෙහි මෙහෙයුම් පිළිගැනීමේ සැසි 2023 වර්ෂයේ දෙවන භාගය තුල ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. මෙම මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීම සිදුවන විට ඊට අදාල දෘඩාංග (Hardware Devices) මිළදී ගැනීම සිදුකළ යුතු බව ICTA ආයතනය මගින් අවධාරණය කරන ලදි. ඒ අනුව රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මත ප්‍රසම්පාදනය සිදුකර මෙම මිළදී ගැනීම සිදු කළ නමුත් සැලසුම් කළ පරිදි නියමිත කාලසීමාව තුල මෙහෙයුම් පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට නොහැකි වුවද මේ වනවිට ව්‍යාපාර ක්‍රියාවලි සිතියම් ගත කිරීමට සහ මෙහෙයුම් පරිසරය සකස් කිරීමට අදාල ක්‍රියාවලීන් පද්ධතියට අදාල සියලු අංශ සමඟ සිදුකරමින් පවතී. හරයාත්මක පද්ධතිය තුල වැඩිබරක් ගන්නා ක්‍රියාත්මක කිරීමේ මොඩියුලයට (Enforcement Module) අදාල ව්‍යාපාර ක්‍රියාවලීන් ලේඛණගත කිරීම මේ වනවිට සියයට 80 ක් පමණ අවසන් කර තිබේ. තීරණාත්මක මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා හැකි ඉක්මනින් ව්‍යාපෘතියට අදාල වැඩකටයුතු නැවත ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලැබී තිබේ. පද්ධතියේ කටයුතු සාර්ථක කර ගැනීමෙන් අනතුරුව ඉහත දෘඩාංග සියල්ල භාවිතයට ගනු ලබන බව.	මිලදී ගත් උපකරණ අරමුණු සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් මණ්ඩලීය කාර්යයන් හා සේවාවන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වැඩි කිරීම සඳහා මණ්ඩලය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ 2021 ඔක්තෝබර් ව්‍යාපෘති කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි. සැලසුම් කාලය වරින්වර සංශෝධනය කර තිබූ නමුත් 2025 අප්‍රේල් මස වන විටත් ව්‍යාපෘති කටයුතු නිමකර සජීවි මෙහෙයුම් ක්‍රියාවලිය බවට පත්	සැලසුම් කළ කාලය තුල ව්‍යාපෘති කටයුතු නිම නොවීමට, ව්‍යාපෘති කළමනාකාරිත්වය හා ICTA ආයතනයේ ගැටුළුකොට්ඨ අධිවසංගත තත්වය, වෙනස් ඉල්ලුම් (CR) සම්පූර්ණ කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීම, තවත් ප්‍රධාන වෙනස්කම් කිහිපයක් පද්ධතිය හා සජීවීව යාමට පෙර සම්පූර්ණ කළයුතුව තිබීම හා OAT ආරම්භ කිරීමට පෙර පද්ධතිය පරීක්ෂා කිරීමේදී පද්ධතිය තුල ගැටලු සහ දෝෂ හඳුනාගැනීම යන කරුණු බලපාන ලදී. ව්‍යාපෘතියේ මෙහෙයුම් පිළිගැනීමේ සැසි 2023 වර්ෂයේ දෙවන භාගය තුල ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. ඒ	පද්ධතිය සජීවි මෙහෙයුම් ක්‍රියාවලියක් වෙනුවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.

	කරගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඉතා අත්‍යාවශ්‍යයැයි හඳුනාගනු ලැබූ දෘඩාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 145.7 ක් වැය දරා තිබුණද, ඉන් රු.මිලියන 18.6 ක් වටිනා උපකරණ 2025 මාර්තු මස අවසානය වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව රඳවා තිබුණි. සේවා ඒකක පිහිටුවීම දැනට පවතින පද්ධතියෙන් නව පද්ධතියට නිවැරදි දත්ත මාරු කිරීම් කටයුතු, විභජනය නොවූ දායක මුදල් හා Lanka Clear සම්බන්ධ කටයුතු නිමකර අරමුණු ඉටුකර ගැනීමට මණ්ඩලය මෙතෙක් අපොහොසත් වී තිබුණි. ව්‍යාපෘතියේ මෙහෙයුම පිළිගැනීමේ සැසි ආරම්භ කිරීමට පෙර ව්‍යාපාර ක්‍රියාවලින් සිතියම්ගත කිරීම සහ මෙහෙයුම් පරිසරය සකසා අවසන් කිරීම් කටයුතු සියයට 98 ක් නිම කිරීමට වාර්ෂික ක්‍රියාකාරී සැලසුම මගින් හඳුන්වා දී තිබුනද වර්තමානය වන විට එහි ප්‍රගතිය සියයට 80 ක් බව සභාපති විසින් වාර්තා කර තිබුණි.	සඳහා ඊට අදාල දෘඩාංග (Hardware Devices) මිළදී ගැනීම සිදුකළ යුතු බව ව්‍යාපෘති කළමනාකාරිත්වය දැරූ ICTA ආයතනය මගින් අවධාරණය කරන ලදි. මීට අමතරව මණ්ඩලය තුල දැඩි උපාංග හිඟයක් පැවතීම නිසාවෙන් ද ලැප්ටොප් පරිගණක යන්ත්‍ර, PC පරිගණක හා ADF Scanners යන්ත්‍රවල දැඩි අවශ්‍යතාවයක් මතුවිය. දෘඩාංග Core System ව්‍යාපෘතිය හා එදිනෙදා වැඩකටයුතු බාධාවකින් තොරව කරගෙන යාම යන කරුණු දෙකම සපුරා ගැනීම සඳහා මිළදී ගත් ඒවා වන අතර ඉහත ඡේද අංක 2.2.4 ආ හි සඳහන් යන්ත්‍ර හැර අනෙක් සියලු යන්ත්‍ර දැනටමත් ප්‍රයෝජනයට ගෙන තිබුණෙන් මණ්ඩලයේ ඵලදායිතාව ඉහළ දැමීම සඳහා උපයෝගී වී තිබේ. ගබඩාවේ 2025.05.09 දින වනවට ඉතිරිව ඇති Document Scanners යන්ත්‍ර 11ක ප්‍රමාණය ඉහත ඡේද අංක 2.2.4 (ආ) හි සඳහන් කළ සැලසුම ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරනු ලැබේ. පද්ධතියේ කටයුතු සාර්ථක කර ගැනීමෙන් අනතුරුව QR Code Scanners සහ QR Code Printers සියල්ල භාවිතයට අවශ්‍ය බව.	
(ඇ)	මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 4.1 ඡේදය ප්‍රකාරව මුළු ආයෝජනයෙන් සියයට 87ක ප්‍රමාණයක් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කල යුතු බවට සඳහන් කර තිබුනද 2023 ,2022 ,හා 2024 වර්ෂයන්හි මුළු ආයෝජනයෙන් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය පිළිවෙලින් සියයට 95 ,97හා 93ක් විය. මෙම සීමා ඉක්මවීම සම්බන්ධයෙන් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි නියමයන් සංශෝධන කර ගැනීමට අවධානය යොමු කර නොතිබුණි.	මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 4.1 ඡේදය ප්‍රකාරව වත්කම් විභජනයට (Asset Allocation) අනුව රජයේ සුරැකුම්පත්වල සියයට 87 ක් පමණද, අනෙකුත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල සියයට 05 ක් උපරිම වශයෙන් ද, කෙටිකාලීන ප්‍රතිමිළදී ගැණුම්වල සියයට 02 ක් සහ ස්කන්ධ (Equity) ආයෝජන (කොටස් සහ ඒකකභාර) උපරිම වශයෙන් සියයට 6 ක් ද වශයෙන් යෙදවිය යුතු බව සඳහන් වේ. මෙම වත්කම් විභජන සංයුතිය (Asset Allocation) මගින් පෙන්වා දී ඇත්තේ සාපේක්ෂව අවධානම් සහිත කොටස්/ඒකකභාර ආයෝජන සහ අනෙකුත් ස්ථාවර ආදායම් සහිත ආයෝජනවල උපරිම වශයෙන් පිළිවෙලින් සියයට 6 ක් සහ සියයට 5 ක් ලෙස ආයෝජනය කළහැකි බවත්, කිසියම් විටකදී එම ආයෝජන එම උපරිම සීමාවන්වලට වඩා පහළ අගයක් ගන්නා අවස්ථාවකදී එම අතිරික්ත අරමුදල් බාධාවකින් තොරව රජයේ සුරැකුම්පත්වල හෝ කෙටිකාලීනව	මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශන නියමයන් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.

		(ප්‍රතිමිළදී ගැනීමේ ගිවිසුම් යනාදිය) ආයෝජන කිරීම සඳහා අවස්ථාව ලබාදීමටය. ඒ අනුව මෙවැනි වත්කම් විභජන සංයුතියක් හඳුන්වාදීමේ අරමුණ වී ඇත්තේ ප්‍රායෝගිකව සහ අවධානම අවම කර ගනිමින් ආයෝජන කළඹ අවස්ථානුකූලව කළමනාකරණය කිරීම සඳහා වූ අවකාශ සලසාදීමට බව.	
(ඇ)	සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම අනුව ස්වයංරැකියාලාභීන් 700 ක් ලියාපදිංචි කර ගැනීමට සැලසුම් කර තිබුන ද ප්‍රගති වාර්තා අනුව සත්‍ය ලියාපදිංචි සංඛ්‍යාව 328 ක් ලෙස දක්වා තිබුණි . සාමාජික සේවා අංශයෙන් විගණනය වෙත ලබාගත් තොරතුරු අනුව වර්ෂය තුල ලියාපදිංචි වූ මුළු ස්වයං රැකියාලාභීන් සංඛ්‍යාව 565 කි .ඒ අනුව ප්‍රගති වාර්තා මගින් දක්වන සංඛ්‍යා හා පරස්පරතාවයක් නිරීක්ෂණය විය. විගණනය වෙත ලබාගත් තොරතුරු අනුව ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 3 කින් පමණක් ස්වයං රැකියාලාභීන් 50 කට වැඩි ප්‍රමාණයක් බඳවාගෙන තිබූ අතර, ප්‍රාදේශීය කාර්යාල 9 කම බඳවා ගත් සංඛ්‍යාව 10 ට අඩු ප්‍රමාණයක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ ලියාපදිංචි ස්වයංරැකියා හා සංක්‍රමණික සේවක සංඛ්‍යාව 43,332 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම ප්‍රමාණය 42,753 ක් වූයෙන් නව සාමාජිකත්වය 579 කි. සංක්‍රමණික සේවකයන් බදවා ගැනීමට හා ප්‍රවර්ධනයට අදාල ව්‍යාපෘති වාර්තාවක් කෙටුම්පත් කරමින් පවතින බව ඉකුත් වර්ෂයේ විගණන වාර්තා නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබා දී තිබුනද, ඒ සම්බන්ධ ප්‍රගතිය ද විගණනයට ඉදිරිපත් නොවුණි.	සමාලෝචිත වර්ෂය අවසානයේ ස්වයංරැකියා හා සංක්‍රමණික සේවා සාමාජික සංඛ්‍යාව පරිගණක පද්ධතිය අනුව 44,495ක් වියයුතු බවත්, ඉකුත් වර්ෂයේ එම ප්‍රමාණය 43,915ක් ලෙස සඳහන් විය යුතු අතර, සමාලෝචිත වර්ෂයට ස්වයංරැකියා හා සංක්‍රමණික සේවා සාමාජිකයින් 580 දෙනෙකු බඳවාගෙන ඇති බව.	ස්වයංරැකියාලාභීන් ලියාපදිංචි කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.
(ඉ)	සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා නොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි සේවායෝජකයින් 22,764ක් විසින් මණ්ඩලය වෙත එවා තිබූ මුළු දායක මුදල රු.මිලියන 505.34කි .මේ සඳහා	පවතින ක්‍රමවේදය යටතේ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව සේවායෝජකයන් වෙත ලබාදෙන සේවා අංකය යටතේම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද ගිණුම්	තොරතුරු ලබාගෙන නිවැරදි සේවායෝජක ගිණුම්වලට බැර කිරීමට කටයුතු කළ යුතුය.

	මණ්ඩලය සුදුසු ක්‍රමවේදයක් මෙතෙක් සකස් කර නොතිබුණි .මේ සඳහා මණ්ඩලය ගනු ලබන ක්‍රියාමාර්ග තවදුරටත් වර්ධනය කල යුතු මට්ටමක පවතී.	සැකසීම සිදුකරනු ලබයි. එයට අමතරව අපගේ ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරන ක්ෂේත්‍ර පරික්ෂණවලින් ලබාගන්නා තොරතුරු පදනම් කරගෙන සහ සේවායෝජකයන්ගේ ඉල්ලීම් මත නව සේවායෝජක ගිණුම් සැකසීම සිදුකරන අතර එම සේවායෝජකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ සේවා අංකයක් ලබාගන්නා තෙක් තාවකාලික අංකයක් යටතේ ලියාපදිංචි කර දායක මුදල් රැස්කිරීම සිදුකර පසුව ස්ථිර සේවක අර්ථසාධක අරමුදල යටතේ සේවා අංකයක් ලබාගැනීමෙන් අනතුරුව එම අංකය යටතේ ලියාපදිංචි කර තාවකාලික ගිණුමේ ශේෂය ඒ වෙත මාරුකිරිම සිදුකෙරේ. එමෙන්ම එම අංක යටතේ ගිණුම්ගත කර ඇති මුදල්වලට අදාල සේවක අර්ථ සාධක අරමුදල හඳුනාගැනීම නිරන්තරයෙන් සිදුවන අතර ඒ සඳහා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලැබේ. එම ආයතන සේවක අර්ථ සාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව නිවැරදි සේවායෝජක අංකය අප විසින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක අතර ප්‍රාදේශීය කාර්යාල හා සේවායෝජකයින් විසින් නිරන්තරයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් අනුව අදාල අංක යටතේ ගෙවීම් කර ඇති මුදල් සේවක අර්ථ සාධක අරමුදල වෙත යොමුකිරීම සිදුකරනු ලබයි. අදාල අංක යටතේ ගෙවීම් සිදුකරනු ලබන සේවායෝජක ආයතන පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාවක් එක් එක් ප්‍රාදේශීය කාර්යාල විසින් එම ප්‍රාදේශීය කාර්යාල බලප්‍රදේශය තුල පිහිටි කම්කරු කාර්යාල වෙත සැපයෙන අතර එම අංක වෙනුවෙන් සේවක අර්ථසාධක අංක ලබාගැනීමට යොමුකිරීම අරමුණ බව.	
(ඊ)	ප්‍රාදේශීය කාර්යාලවල ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක නොවන බැවින් හා මධ්‍යගත කළමණාකරනයක් සිදුකළ හැකි ජාලයක් මණ්ඩලය සතු නොවන බැවින් ප්‍රාදේශීය කාර්යාල මගින් ජාලයට සිදුවිය හැකි අවශ්‍ය නොවන ප්‍රවේශයන් අවහිර කිරීමට මණ්ඩලය ජාලගතකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සැලසුම් කර මෙතෙක් එය සම්පූර්ණයෙන්ම නිම කර නොතිබුණි.	ප්‍රාදේශීය කාර්යාලවල ආරක්ෂණ පද්ධතියක් (Fairewall) ක්‍රියාත්මක නොවන බැවින් හා මධ්‍යගත කළමණාකරනයක් සිදුකළ හැකි ජාලයක් මණ්ඩලය සතු නොවන බැවින් ප්‍රාදේශීය කාර්යාල මගින් ජාලයට සිදුවිය හැකි අවශ්‍ය නොවන ප්‍රවේශයන් අවහිර කිරීමටත්, ආරක්ෂණ තර්ජන (Cyber Threat) පාලනය කිරීමටත් ඉතාමත් ඉක්මණින් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය. මෙකී අවශ්‍යතා සපුරා ගැනීම SD WAN ජාලයක් මගින් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය	අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතුය.

කාර්යාල සහ දත්ත මධ්‍යස්ථාන සම්බන්ධ කිරීමට වැඩසටහනක් ආරම්භ කරන ලදි. ඒ මගින් සමස්ථ පරිගණක ජාලයටම Fairewall ආරක්ෂාව ලබාදීමද අනවශ්‍ය වෙබ් අඩවි සඳහා ඇති ප්‍රවේශය අවහිර කිරීමද එක් සබඳතාවයක් මගින් මුළු මණ්ඩලය සතු කාර්යාල ආවරණය වීමද මධ්‍යතග කළමණාකරනයක් යටතට පරිගණක ජාලය ගෙන ඒමද පරිගණක ජාලයේ වේගය හා විශ්වාසනීයත්වය වැඩි කිරීම ද හරයාත්මක පද්ධතියට ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රවේශය ලබාදීමට ද හැකි අතර දැනට මණ්ඩලයේ සියළු කාර්යාල ආවරණය වන පරිදි සාර්ථකව ආරම්භ කරන ලද බව.